# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1840/52 - 2013 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2013.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 45

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් සියළු සුවඳ කූරු/හඳුන්කූරු සාදන්නන්, ආනයනකරුවන් සහ වෙළෙඳුන්, ඔවුන් විසින් නිෂ්පාදිත/ආනයනික සියළු සුවඳ කූරු/හඳුන්කූරුවල උපරිම සිල්ලර මිල, නිෂ්පාදන කාණ්ඩ අංකය, කල් ඉකුත් වන දිනය, ශුද්ධ බර සහ සාදන්නාගේ සහ/හෝ ආනයනකරුගේ නම සහ ලිපිනය එම සුවඳ කූරු/හඳුන්කූරු අඩංගු ඇසුරුමේ හෝ බහාලුමේ හෝ දවටනයේ සඳහන් කළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2014 ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12-1244/1

---

විධාන අංක 46

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර විෂය පථය යටතේ විස්තර වන දේශීයව නිෂ්පාදනය කරනු ලබන පහත තීරු 1හි සහ 2හි විස්තර කර ඇති අයිතමයන් ශ්‍රී ලංකා ප්‍රමිති

1A - PG 1876 — 300 (2013/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය දරන්නේ නම් මිස, කිසිම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

| *1 වැනි තීරුව*<br>*භාණ්ඩ* | *2 වැනි තීරුව*<br>*ප්‍රමිති නාමය සහ අංකය* |
|---|---|
| දෙවන තීරුව යටතේ සඳහන් කර ඇති අදාළ ප්‍රමිතියෙහි විෂය පථයෙහි දක්වා ඇති භාණ්ඩ | SLS 733 - විදුලි බල, ආලෝකනය සහ අභ්‍යන්තර රැහැන් ඇදීම සඳහා යොදා ගන්නා වෝල්ට් 450/750V දක්වා එම අගයන් ද ඇතුළත් පී. වී. සී. පරිවාරක, තඹ සන්නායක සහිත සන්නාහ නොකරන ලද රැහැන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර. |
| දෙවන තීරුව යටතේ සඳහන් කර ඇති අදාළ ප්‍රමිතියෙහි විෂය පථයෙහි (b) කොටසෙහි සඳහන් කර ඇති වගුව 13, වගුව 14, වගුව 15, වගුව 16 සහ වගුව 17 හි දක්වා ඇති තාප සුවිකාර්ය පරිවාරක සහිත නම්‍යශීලී රැහැන් | SLS 1143 - ගෘහස්ථමය, කාර්යාල සහ ඒ සමාන පරිසරයන් හි භාවිත උපකරණ සඳහා වෝල්ටීයතාවය 300/500V දක්වා යොදා ගන්නා සුනම්‍ය විදුලි රැහැන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර. |

මෙම විධානය වර්ෂ 2014 දෙසැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12-1244/2

---

විධාන අංක 47

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

12(2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන මදුරු දඟර හෝ මදුරු මැට් කිසිම නිෂ්පාදකයකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දකු විසින් එකී එක් එක් මදුරු දඟර ඇසුරුමෙහි හෝ මදුරු මැට් ඇසුරුමෙහි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය ප්‍රකටව පෙනෙන ස්ථානයක පැහැදිළිව මුද්‍රණය කර ඇත්තේ නම් මිස එකී මදුරු දඟර හෝ මදුරු මැට් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධානය කරනු ලැබේ.

මදුරු දඟරු සඳහා වන ප්‍රමිති පිරිවිතර SLS 453

මදුරු මැට් සඳහා වන ප්‍රමිති පිරිවිතර SLS 930

මෙම විධානය වර්ෂ 2014 දෙසැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

මේ සම්බන්ධයෙන් 2007 පෙබරවාරි මස 15 වැනි දින අංක 1454/6 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද විධාන අංක 10 මෙයින් පරිච්ඡින්න කරනු ලබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2013 දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12-1244/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.